# ඉන්දුනීසියාවේ කලා මැදුරු

තිරාණගම රතනසාර හිමි

ඉන්දුනීසියාවේ අටවැනි සියවසේ පටන් නවවැනි සියවස දක්වා කාලය අතර රාජ්‍යය කළ ශෛලෙන්ද්‍රවංශ රජවරුන් විසින් කරවන ලදැයි සම්මතවූ කලාත්මක ගල්විහාර ආශ්‍රයෙන් දැනගත හැකි පාඩම් බොහෝය. ශෛලෙන්ද්‍රවංශ, පංචපාන, පනුංගලන්, වරොක්, ගුරුන්, පිකතන්, කයං වංගි, වතුකුමලන් යනාදී බෞද්ධ රජවරුන් විසින් කරවන ලද අරුම පුදුම කලාත්මක වෙහෙර විහාර ගොඩනැගී ඇත්තේ මද්ධ්‍යම ජාවා—සුපිහිටි තැනිතලාවකය. සුරකාර්තා, ජොග්‍යාකාර්තා, මගලාන්, යන ප්‍රදෙශයන් ඊට ඇතුළත්ය. තත්කාලීන බෞද්ධ කලාත්මක වස්තූන් කෙතරම් දියුණු වී පැවතුනේද යන්න, බෞද්ධ කලා ප්‍රදර්ශනාගාරයන් සේ උද්දීපනය වන බෝරෝබුඩූර්, මෙන්ඩුත්, පාවොන්, බුබ්‍රාහ්, ලුම්බුන්, සේවූ, පලෞවුෂාන්, කලාසාන්, සාරී, යන වෙහෙර විහාර වලින් ප්‍රකාශ වේ. 'පරම්බානන්' හි හින්දු කලාත්මක වස්තු බහුලය. ඒ අනුව හින්දු ධර්මය එරටවාසීන් විසින් එද කෙසේ පිළිගන්නා ලද්දේද යනු සිතා ගැනීම දුෂ්කර නො වේ.

ඔප මට්ටම් කළ කලුගල් කුට්ටි එක පිට එක තබා ගොඩ නැගූ ඉන්දුනීසියාවේ බෞද්ධ හා හින්දු කලා මැදුරු රසාත්මකවූ කලාත්මක කෘතීන්ගෙන් සංයුක්තයි. අට–නවය යන සිය වස් හිදී ඉන්දුනීසියානු බඩ සුමාත්‍රා, ජාවා, කුලිමන්තන්, සුලවාසී, බාලි යන දිවයින්වලැ බුදු දහම පැතිරීගිය ආකාරය මා වටහා ගත්තේ ඒ ස්ථානයන්හි අද දක්වාමත් රැඳී තිබෙන අගනා බෞද්ධ කලාත්මක කෘතීන් ලෙස හැඳින්විය හැකි, බුදු පිළිම, ස්තූප, ජාතක කථා, බුද්ධ චරිතය, ආදිය මවා පාන දක්ෂ කලා ශිල්පීන් විසින් නිර්මිත කරණ ලද පුරාවිද්‍යාත්මක වස්තූන් නිසයි. එකල බෞද්ධ රටක්වූ ඉන්දුනීසියාව මෙකල මුස්ලිම් රටකි. එහෙත් ඇප්ඝනිස්තානය, ඉරානය තරම් තද මුස්ලිම් භක්තිකයන් එහිදී මා දුටුවේ නැත. බාලි—ජාවා යන රටවල තවමත් ඉස්ලාම් බෞද්ධ, හින්දු බෞද්ධ යනුවෙන් හැඳින්වූවෝ මා සමහ සාකච්ඡා කළ වාර බොහෝය. ඉන්දුනීසියාවේ ඓතිහාසික කලාත්මක වස්තු ආරක්ෂාවන්නේත්, ඒ පිළිබඳ අවශ්‍ය පයෙර්ෂණ පවත්වන්නේත් එරට පුරාවිද්‍යාත්මක අංශය සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අංශයද එකාබඩ වීමෙනි.

ඉන්දුනීසියාවේදී මා හිත් නෙත් ඇදී ගියේ මධ්‍යම ජාවා ප්‍රදෙශයේ තැන් තැන්වල හඬා වැලපෙමින්ද සිය කලණ මිතුරන් හතුරු උවදුරුවලින් ඉවත් වී මෙන්ද තනිවූ සුරූපී උපාසිකාවන් වැනි බෞද්ධ කලාමැදුරු කෙරෙහිය. මධ්‍යම ජාවා 'මගලාන්' නගරයේ සිට සැතපුම් තිස් හතක් ඈතින් තැනිතලාවකින් වටවූ කඳුගැටයක් මත සුපිහිටි මහා පර්වතයක් හූරා විසිතුරු ලෙස කැටයම් කළ එකම කලාගාරයක් වැනි ''බෝරෝබුඩූර්'' මහා චෛත්‍යරාජයානන්ය. ඒ අවට ගම් පෙදෙසද ''බෝරෝබුඩූර්'' යන නමින් හඳුන්වනු ලැබේ. ''බෝරෝබුඩූර්'' යනු ඉන්දුනීසියානු ව්‍යවහාරයෙහි එන ශබ්ද මාලාවට අයත් අක්ෂරයන් ය. එයින් ප්‍රකාශ වන අර්ථය (බෝරෝ–විහාරය බුඩූර්–කන්ද) කන්දේ විහාරය යනුයි. කඳු උඩ ගොඩ නැගූ විහාරයන්ට ''කන්දේ විහාරය'' යනුවෙන් ව්‍යවහාර කිරීම ලංකාව, චීනය, ජපානය, බුරුමය, ආදී රටවලද පවත්නා සිරිතකි.

''බෝරෝ බුඩූර්'' හි මෙකල ශිලාලෙඛන, සන්නස් ආදී කිසිත් නැත. තත්කාලීන ශිලා ලේඛනයන්හි බෝරෝබුඩූර් මහා ථූපය ගොඩනැන්වූ වකවානුවක් ස්ථිරව සඳහන් වී නැත. ඉන්දුනීසියානු ඓතිහාසික ප්‍රවෘත්තීන් අනුව ශෛලෙන්ද්‍රවංශ රජවරුන් විසින් රාජ්‍ය වර්ෂයෙන් 850 දී මෙය ගොඩනන්වා අවසන් කරණ ලදැයි විශ්වාස කළහැක. ශෛලෙන්ද්‍රවංශ යුගය

රාජ්‍ය වර්ෂයෙන් 732 සිට 900 දක්වා කාලය ඇතුළත් වේ. පල්ලව යුගයට අයත් පැරණි ජාවා අකුරු සඳහන් සෙල්ලිපියක් අනුවද 8–9 ශතවර්ෂ තුළ ශෛලෙන්ද්‍රවංශ රජවරුන් විසින් කරවන ලද්දක් බව ඔප්පුවේ. කඳුකරයෙහි වාසය කළ නිසා එයම අන්වර්ථනාමයක් කරගෙණ තත්කාලීන රාජවංශය ''ශෛලෙන්ද්‍රවංශ'' යන නමින් ව්‍යවහාර කරණ ලදි.

චතුරශ්‍රාකාරව ගොඩ නැගූ මේ මහා ථූපයේ උස අඩි එකසිය හැත්තෑවකි. මහායානික දර්ශනිකයන් ගේ විවරණයන් අනුව බෝරෝබුඩුර්-මහා ථූපය ප්‍රමුදිත, විමල, ප්‍රභාකාරී, ආර්චිස්මතී, සුදුර්ජය, අභිමුක්ති, දූරන්ගම, අචල, සාධුමතී, ධර්මමෙඝ, යී කියා දශ භූමියකින් වෙන්වූහ. මෙයට හුරුකම් ඇති මෙතරම් කලාත්මක නොවූ ගඩොල්වලින් ගොඩනැගූ මහා ථූපයන් තායිලන්තය, බුරුමය, කාම්බෝජය, යන රටවලද තිබේ. සලපතල මළුව හැර බෝරෝබුඩුර් මහා ථූපය වටේ ප්‍රදක්ෂිණා පථ අටකින් සමන්විතය. සතර දිශාවෙන්ම මහා ථූපය මුදුනට යා හැකි වනසේ තරප්පු පෙළි හතරකි. කොරවක්ගල් සහ මකර තොරන්වලින් සමන්විත ඒ තරප්පි පෙළි, පැලාපෙති, ලියවැල්, නාරිලතා, සහ විවිධ කැටයම්වලින් සැරසී තිබේ. මහා ථූපයේ මුල්වටය අපායේ එක් එක් අවස්ථා පිළිබිඹු වන සේ නිමවූ නිසා එය ''කාමධාතු'' නමින් හඳුන්වනු ලැබේ. පසුගිය ලොක මහා සංග්‍රාමයේදී ජපනුන් විසින් පරීක්ෂණ පවත්වා හාරා පාද ගත් ඒ ''කාමධාතු'' නම් කොටස නිසා බෝරෝබුඩුර් මහා ථූපයේ අභිනව පරිච්ඡේදයක් පහළ විය. ප්‍රථම ප්‍රදක්ෂිණා පථයෙහි සිද්ධාර්ථ කුමාරොත්පත්තිය ප්‍රකාශවන සේ කැටයම් කර ඇත්තේ සිද්ධාර්ථ චරිතය පිළිබඳ ප්‍රත්‍යක්ෂ ඥනයක් සිත් සතන් තුළ පහළවන අයුරිනි. වචන ලක්ෂ ගණනකින් ඉගෙණගතයුතු කරුණු රාශියක් කලාත්මක වස්තූන්ගෙන් ප්‍රත්‍යක්ෂ කර ගැණීමට එහි ප්‍රස්ථා සැළසී තිබේ. දෙවැනි ප්‍රදක්ෂිණා පථයෙහි ගෞතම බුද්ධ චරිතය මූර්තිමත් කර ඇත්තේ ආසියාවේ අන් කවර රටකවත් නුවූ විලාශයකිනි. ඉන්දියාව ආදී අන්‍ය රටවල ගෞතම බුද්ධ චරිතය කැටයම්කර ඇතත් අද කැඩී බිඳී ගිය කොටස් පමණක් දර්ශනය වේ. දෙවැනි මාළයේ පිටිපස වේදිකාවෙහි ජාතක කථාවන්හි සඳහන්වූ මූලික ලක්ෂණ අඩංගු ප්‍රවෘත්තීන් ගැබ්කොට කළ කැටයම් අනුව කලාශිල්පීන් තුළ පහළ වන්නේ නිර්මාන ශක්තියක්මය. රූප ගැළපීමත් ඒවායේ ප්‍රාණවත් ලක්ෂණත් කථාහරය ගැබ් කිරීමත් මූර්ති ශිල්පියා මොහොතකට වත් අමතක කර නැත. තුන්වැනි ප්‍රදක්ෂිණා පථයන්හි සම්මා සම්බුදුපියානන් වහන්සේ ගේ පෙර ආත්මභාවය සඳහන් කථා ප්‍රවෘත්තීන් ද මෛත්‍රෙය බෝධිසත්ව චරිතය ද ගල් බිත්තිවල ඉලිප්පී පෙනෙන සේ කැටයම්කර තිබේ. හතරවැනි ප්‍රදක්ෂිණා පථයෙහි සමන්තභද්‍ර බුදුන්ගේ සහ වෙනත් බුදුවරයන් ගේ විවිධ අවස්ථා සඳහන් වූ ප්‍රතිමාවන් ද දක්ෂ ලෙස මූර්තිමත් කරන්ට ඇත්තේ මහායානය පිළිබඳ සැහෙන තරම් අවබොධයක් ලබා සිටි ශිල්පීන් විසින් විය හැක. බුද්ධ ධර්මය ගැණ තත්වඥනයක් එකල කලා ශිල්පීන් තුළ නුවූවා නම් බෝරෝබුඩුර් මහා ථූපයේ එතරම් උසස් නිර්මානයන් ඇති වීමට ඉඩ නැත. පස්වැනි වහල කවාකාරයෙන් සකස්වීමකි. එහි කැටයම් කිසිත් නැත. විචිත්‍රත්වයක් නොපෙනේ. රූපධාතු සහ අරූපධාතු සම්බන්ධයෙන් තියුණු අවබොධයක් ඇතිවනසේ ද නිර්වාණධාතුව ගැණ මූර්තිමත් කර පෙන්වනසේ ද ''බෝරෝබුඩුර්'' මහා ථූපය ප්‍රතිෂ්ඨාපනය කළා විය හැක. භුවනත්‍රය සම්පිණ්ඩනය කොට රූප ගළපා බොධිසත්වයෙකු බුද්ධත්වය ලබා නිර්වාණයට ගිය මාර්ගය පෙන්වීමක් යයි එක්වරම දර්ශනිකයෙකු තුළ පහළ වන්නේ ''බෝරෝබුඩුර්'' මහා ථූපයේ හරිතත්වය ගැණ පයෙෂීෂණාත්මකව බැලීමෙනි. ''අරූපධාතු'' නමින් හඳුන්වනු ලබන කවාකාර වේදිකා තුනක කලුගලෙන්ම ගොඩනැන්වූ අඩි අටක් තරම් උසැති ථූප හැත්තෑ දෙකක් ඉදිකර තිබේ. ඒ ථූප ඇතුළේ කුහරයන්ය. සෑම ථූපයකම විතර්ක මුද්‍රාවෙන් යුත් වෛරොචන බුද්ධ ප්‍රතිමාවන් සහ ධර්මචක්‍ර මුද්‍රාවෙන් යුත් වජ්‍රසත්ව බුද්ධප්‍රතිමාවන් පිහිටුවා තිබේ. ඉහළ මැද මහා ථූපය යි. අභ්‍යාවකාශයක එය පිහිටීමෙන් ප්‍රකාශ වන්නේ නිර්වාණ මාර්ගය යි.

ආසියාතික බෞද්ධයින්ගේ මතාන්තරවල හැටියට බුද්ධප්‍රතිමා මුද්‍රා ලක්ෂණ රාශියකින් සමන්විතය. ෂට්විධ මුද්‍රාවකින් යුත් චතුර්බ්‍රහම විහරණයන්ගෙන් ගැවසුණු සොභමාන බුද්ධ ප්‍රතිමා ''බෝරෝබුඩුර්'' මහා ථූපයෙහි ප්‍රදර්ශනය වේ. නැගෙණහිර දිශාවෙහි භූමිශ්පර්ශ මුද්‍රාවෙන් යුත් අක්ෂොභ්‍ය බුද්ධ ප්‍රතිමාවන්ද දකුණු දිශාවෙහි වර මුද්‍රාවෙන් යුත් රත්න සම්භව බුද්ධ ප්‍රතිමාවන්ද උතුරු දිශාවෙහි අභය මුද්‍රාවෙන් යුත් අමොඝසිද්ධි බුද්ධ ප්‍රතිමාවන්ද බටහිරි

දිශාවෙහි ධ්‍යාන මුද්‍රාවෙන් යුත් අමිතාභ බුද්ධ ප්‍රතිමාවන්ද, මැද පෙළෙයෙහි විතර්ක මුද්‍රාවෙන් යුත් වෛරෝචන බුද්ධ ප්‍රතිමාවන්ද ඉහළ පෙළෙයෙහි ධර්මචක්‍ර මුද්‍රාවෙන් යුත් පස්යතුම බුද්ධ ප්‍රතිමාවන්ද හාරසිය තිස් දෙකක් ඇත්තේය. එක් පිළිමයක උස ප්‍රමාණ අඩි දෙකහමාරක් පමණ වේ. මුද්‍රා ලක්ෂණ යයකින් සමන්විත බුදු පිළිම රූප ලක්ෂණ අතින් සම්පූර්ණත්වයක් උසුලයි. බොධිසත්වයන් වහන්සේ බුදුකුරු දම් පුරා බුද්ධත්වය ලබා නිර්වාණයට ගිය ආකාරය මූර්තිමත් කොට පෙන්වන සේ බෝරෝබුදුර් මහා ස්ථූපය නිර්මාණය කළා විය හැක. මූර්ති, කැටයම්, සහ ගෘහ නිර්මාණය පිළිබඳ කලාත්මක අවබෝධයක් ලැබෙන සේ සකස්වූ මේ මහා ස්ථූපය එකම කලාගාරයකි. රාජ්‍යවර්ෂයෙන් අටවැනි සියවසේ දී ලංකාවේ සිට ඉන්දුනීසියාව හරහා චීනයට ගිය 'මුගලන්' නැමැති කුමාරයෙකුගේ උපදෙස් අනුව ''බොරෝබුදුර්'' මහා ස්ථූපය ගොඩනැන්වූයේ යයි අද දක්වාමත් එරට ජනතාව අතර කුතුහල රැව පිළිරැව දෙමින් පවතී.

කලුගල් කුට්ටිවලින්ම ගොඩනැන්වූ ''මෙන්දුත්'' විහාරය ද ඒ අසලම නැගීතලාවක පිහිටා තිබේ. බිමත්, වහලත්, බිත්තිත්, ප්‍රාකාරයත්, වේදිකාවත්, පියගැට පෙළත්, ප්‍රතිමා සහ කැටයම් ආදියත් ඔප මට්ටම් කළ කලුගල්වලින්මය තිබෙනා ඇත්තේ. පත්මපාණි, අවලොකිතෙශ්වර, විතර්කමුද්‍රා, යන ලක්ෂණ වලින් සමන්විත ප්‍රතිමා තුනක් මන්දිරය තුළ නිර්මාණය වී තිබේ. මහා පුරුෂ ලක්ෂණයන්ගෙන් පරිපොෂිතව සිංහාසනාරූඪව වැඩ සිටින තෙජොබල මහිමයකින් විරාජමාන වන විතර්ක මුද්‍රාවෙන් යුත ඒ බුද්ධ ප්‍රතිමාවේ විශෙෂම ගතිය නම් පාද යුග්මය ආසනයෙන් පාතට වැටෙන සේ නිර්මානය වීමය. එවැනිම ලක්ෂණයන් ගෙන් ගැවසුනු බුද්ධ ප්‍රතිමා ඉන්දියාවේ නාසික්, කැනරි, අජන්තා යන ලෙන් විහාරවලද, චීනයේ යුන් කුවාන්, තුන්හුවාන්, ලුන්මන් යන ලෙන් විහාරවලද තායිලන්තයේ නකෝර්න් පටෝන්හි ද කලුගලෙන් නිර්මානය වී තිබේ. රාජ්‍යවර්ෂයෙන් දෙවැනි ශතවර්ෂයේ දී නාගාර්ජුන කොණ්ඩයෙහි මූර්තිමත් කළ ගල් කැටයම් පුවරුවලද එවැනිම හැඩහුරුවකින් යුත් බුදු පිළිම මූර්තිමත්ව තිබේ. රාජ්‍ය වර්ෂයෙන් 850 දී පමණ ගොඩනැන් වූයේ යයි සැළකිය හැකි මෙන්දුත් විහාරය තත්කාලීන ගෘහ නිර්මාන ශිල්පය මවාපානා සුළුය. මහායානික අදහස්වලට ගැවෙමින් කළ ඒ විහාරයෙහි ඊට අනුබඳ කලාත්මක වස්තූන්ම ගැවසී ඇත. එහි පිට ගල් බිත්ති තුනක ආයධිනාරාවගේ ප්‍රතිමා මූර්තිමත් කර තිබීමෙන් ද 'අමිතාභ' බුදුන් වහන්සේට මෙන්ම බොසත් වරුන්ටද සමව විහාරය තුළ ආසන පනවා තිබීමෙන් ද වැඩිදුරටත් එය මහායානික කෘතියක් බවට නිදසුන්ය. ගොඩනැගිලි සම්ප්‍රදය එරටටම ආවේනික වූ බෞද්ධ විහාර සම්ප්‍රදයකි.

කලාසාන් විහාරය ''පොගයාකාර්තා'' සිට සැතපුම් 17 ක් ඈතින් පෙල් පළියෙන් ඒකාලෝකවූ සෞන්දර්‍යවිස්වාදයක් ලැබිය හැකි තැනිතලාවක සුපිහිටි චමත්කාර ජනක විහාරයකි. රාජ්‍ය වර්ෂයෙන් නවවැනි සියවසෙහි ගොඩනැගූ කලාසාන් විහාරයේ ගල් බිත්ති කන්නාඩියක් දිලිසෙන්නාසේ බබලන්නේ සූර්‍යාලෝකය වැටෙන කල්හිය. ගල් ඔපමට්ටම් කර ගැණීමේ ශාස්ත්‍රය එකල කලා ශිල්පීහු හොඳින් දැන සිටි බව එයින් පෙනේ. ඇතැම් කොටස් ගරාවැටීම නිසා එහි පැවැති පරම සුන්දරත්වයට හානිවූවා සේය. මා සමඟ එහි ගිය ඉන්දුනීසියානු පුරාවිද්‍යා නිලධාරීහු කණට කොඳුරා කීවේ මන්දිරය දෙදරුම් කා ඇති නිසා එහි තුළට නොයා යුතු බවය. එහෙත් මා රත්නත්‍රයේ ආශිර්වාදයෙන් වෙනදෙයක් වේවා කියා එහි ඇතුළට ගොස් නතුසොයා බැලීමෙන් වඩාත් යම් යම්දේ ඉගෙණ ගත හැකි විය. කලාශාන් විහාරය වටේ කුඩා ස්ථූප පනස් දෙකකි. ඒ ස්ථූප තුළ එහි වැඩ සිට දිවංගත තෙරවරුන්ගේ භස්මාවශෙෂාදිය නිධන් කොට ගොඩනැගූ බව පරීක්ෂණ අනුව හෙළි පහළි විය. කුඩා ස්ථූප පිළිබඳ පයෙෂණ පැවැත්වීමෙන් පසු සොයාගත් ගල් භාජන අසූ එකකි. ඉන් සමහරක් නිව්සීලන්තයේ කෞතුකාගාරයක ප්‍රදර්ශනය වේ. ගල් භාජනවල තිබී සොයාගත් නිධන් වස්තු අතර දැවුණු ඇටකැබලි හා අලු, පුංචි මුහුනබලන කැඩපතක්, තඹ සහ පිත්තල මිශ්‍ර තහඩු කැලි දෙකක්, ඉඳිකටු දෙක තුනක්, රැවුල කපන පිහියක්, සිවුරු කැල්ලක්, දම්වැල් කැල්ලක්, බුද්ධ-ධම්ම-සංඝ යි කියා ලියූ රිදී සහ රන් තහඩු කැලි දෙකක්, පුංචි මැණිකක් අක්නට ලැබේ. මින් සමහරක් සුරකාර්තා රාදය ප්‍රස්තක කෞතුකාගාරයෙහි ප්‍රදර්ශනය වේ. මෙකී වස්තූන් අනුව මානව විද්‍යාඥයන්ට සහ පුරා විද්‍යාඥයන්ට ස්ථිර තීරණයක් ගැණීම පහසු වී තිබේ.

මධ්‍යම ජාවා පරම්බානන් අසළ පිහිටි ''සාරි'' ආරාමය භික්ෂු සංඝයා වැඩ වුසූ කලු ගලෙන්ම ගොඩ නැගූ දෙමහල් මැදුරකි. එහි පිටත බිත්තිවල දේවතා රූප මූර්තිමත්කර ඇත්තේ සංඝාරාමයේ ආරක්ෂාව පිණිස රැකවරණෙහි යෙදුණු විලාශයකිනි. එසේ අරක් ගත් දෙවිවරුන් ගේ රූප ලක්ෂණය සිත් නෙත් අලවන සුළුය. මන්දිරය තුළ ප්‍රතිමා කිසිත් නැත. කලු ගල් ලෑලිවලින් ම පියැස්ස ද නිමවා ඇත්තේ වැහි බිංදුවක් වත් කාන්දු නොවන සේ ය. උෂ්ණ කාලයට ශීතත්, ශීත කාලයට උෂ්ණයත් ඇතිවන සේ එකල ගෘහ නිර්මාන ශිල්පීහු ගොඩනැගිලි එං ලෙස ගොඩනැන්වීමෙ දක්ෂතාවයක් ඇතිව වූසූහ. මෙකී ''සාරී'' ආරාමය ජනාවාස පෙදෙසක පිහිටා තිබිනි. ''චන්දි'' යන්නෙහි තේරුම පන්සල (විහාරය) යන අර්ථ යයි. චන්දි බෝරෝබුඩූර්, චන්දි මෙන්ඩුත්, චන්දි කලාශාන්, චන්දිසාරි, චන්දි සැවෝ ආදී වශයෙන් විහාරස්ථාන හැඳින්වීම ඉන්දුනීසියන් වරුන්ගේ සිරිත ය. ශෛලෙන්ද්‍රවංශ යුගයෙහි රාජ්‍යය කළ රජවරුන් විසින් ගොඩනන්වන ලද ගල්විහාර මධ්‍යම ජාවාහි නොයෙකුත් පෙදෙස්හි දී දක්නට ලැබේ.

ජකාර්තා, ජොගයාකාර්තා, සුරකාර්තා, පරම්බානන්, මොජපාහිත්, ඩෙන්පසාර්, යන ස්ථානයන්හි පිහිටි කෞතුකාගාරයන්හි විවිධ මුද්‍රා ලක්ෂණවලින් සමන්විත බුදු පිළිම, බෝසත් පිළිම සහ දෙව රූප බොහෝය. ගල්, ලෝකඩ, රන්, මැටි, ආදී ද්‍රව්‍යවලින් නිර්මිත ඒ පිළිම වැඩිහරියක් ශෛලෙන්ද්‍ර වංශ යුගයට අයත් ය. මැටි පිළිම බොජපාහිත් යුගයෙහි මූර්තිමත් කර තිබේ. නැගෙණහිරි ජාවා, මොජෙව්, කාර්තෝ, පොරොං, බිල්ටාර්, පංඩාකාන් යන ස්ථානවලැ තිබෙන ස්තූප හා විහාර මැටි, ගඩොල් වලින් ම ගොඩනැන්වුනු ඒවා ය. 11,12 යන සියවස්හිදී මොජපාහිත් යුගයේ නැගෙණහිරි ජාවා පෙදෙස් හි හින්දු බලපෑම් ඇතිවීම නිසා බෞද්ධ හින්දු මිශ්‍ර සමාජයක් වූසූයේ යයි විශ්වාස කළ හැක. ඒ කාලයට සමානකම් දක්වෙන කැටයම් හා මූර්ති කාම්බෝජයේ සියම්රීප් පෙදෙසෙහිදී ද දක්ක හැකිවේ. 13 වැනි සියවසෙහි නැගෙණහිරි පාවාහි හින්දු කලාව බලසම්පන්නව දියුණු වූ බව පෙනේ. මොජපාහිත් යුගයෙහි පූර්ණඝට, කිබිසි මුහුණ, මකර සහ මැටි පිළිම සම්ප්‍රදය දියුණු වූ තත්වයක පැවතින. බුද්ධ ධර්මය හා හින්දු ධර්මය ආශ්‍රයෙන් ඉන්දුනීසියාවේ කලාත්මක වස්තු ඇතිවූ හ. එරට ජාතික කලාවක් වශයෙන් පෙනී යන්නේ බෞද්ධ හා හින්දු කලාකෘතීන්මය. සුමාත්‍රාව, සුලවාසී සහ බාලි යන දිවයින්වලැ කලාත්මක වස්තූන්ද බුදුසමය පසුබිම් කරගෙණ මූර්තිමත්ව තිබේ.

පහළොස් වැනි සියවසෙහි අරාබිජාතික ''ටකාම් සයිඩ් මව්ලානා මලික් ඊබ්‍රාහිම්'' නැමැති ඉස්ලාම් ආගමික පූජක වරයා ප්‍රධාන පිරිසක් නැගෙණහිර ජාවා සුරබයා නගරාසන්නයෙහි ග්‍රෙෂික්හි පදිංචි වූහ. වෙළඳාම පිණිය මුහුදු යාත්‍රාවලින් පැමිණි ඔවුහු ''ඉස්ලාම්'' ආගම පතුරුවමින් ක්‍රියා කළහ. එවක් පටන් ක්‍රම ක්‍රමයෙන් ඉන්දුනීසියාවේ ඉස්ලාම් ආගම පැතිරී ගිය හ. බෞද්ධ කලාත්මක වස්තූන් ද විනාශයට පත්වූ හ. වර්තමානයෙහි එරට ඉස්ලාම් බෞද්ධ හා හින්දු බෞද්ධ නමින් හැඳින්වෙන අය ද වෙති.